සියලු ම හිමිකම් ඇවිරිණි /
All Rghts Reservrd /



# රිච්මන්ඩ් විද්‍යාලය - ගාල්ල

## පළමු වාර පරීක්ෂණය

## ක්‍රිස්තු ධර්මය

11 ශ්‍රේණිය

කාලය : පැය 1 1/2

RICHMOND COLLEGE LIBRARY GALLE

නම : ..............................................................................................................................

වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. බැබිලෝනියේ සිට කානාන් දේශය කරා ජන කණ්ඩායම් සංක්‍රමණය වීම ආරම්භ වුයේ,

1. ක්‍රි.පු. 17 වන සියවසේ
2. ක්‍රි.පු. 19 වන සියවසේ
3. ක්‍රි.පු. 20 වන සියවසේ
4. ක්‍රි.පු. 16 වන සියවසේ

02. ආබ්‍රහම් යන නාමයේ තේරුම

1. උතුම් පියා
2. විශ්වාසයේ පියා
3. ජාතීන්ගේ පියා
4. ආදි පියා

03. අටවන පණත

1. මිනී නොමරව
2. කාමමිත්‍යාචාරය නොකරව
3. බොරු සාක්ෂි නොකියව
4. සොරකම් නොකරව

04. මෙසියස් වහන්සේ උදාකරන රාජ්‍යයේ සාමයට කෙලවරක් නොමැති බව පැවසුයේ

1. යෙසායා දිවැසිවරයාය
2. මීකා දිවැසිවරයාය
3. එසකියෙල් සිවැසිවරයාය
4. මලාකි දිවැසිවරයා

05. ඉශ්‍රායෙල්වරු තම එඬේරා ලෙස පිළිගත්තේ

1. ජේසුස් වහන්සේ ය
2. ආබ්‍රහම්ය
3. දෙවියන් වහන්සේ ය
4. මෝසෙස්ය

06. ''මා පැමිණියේ ඔවුන් හට ජීවනය ලැබෙන පිණිසය, සපුරාම එය ලැබෙන පිණිසය'' මෙසේ සඳහන් වන්නේ

1. ලුක් සුවිශේෂයේය
2. ජොහාන් සුවිශේෂයේය
3. නික්මයාමේ ය
4. ක්‍රියා පොතේය

07. ජුදා සෙනග බැබිලෝනියට රැගෙන යන බවට අනාවැකියක් පැවසුවේ

1. අගබස් ය
2. ජෙරමියා ය
3. යෙසායා ය
4. බාර්ණබස්ය

08. සඳහටම පවතින ශ්‍රේෂ්ඨතම ධර්මතාව කුමක්ද?

1. සාමය යි
2. නිරෝගිබව ය
2. විශ්වාසය යි
4. ප්‍රේමය යි

(දෙවැනි පිටුව බලන්න)

සියලු ම හිමිකම් ඇවිරිණි /
All Rghts Reservrd /



09. එලිසබත් විසින් මරියතුමිය හඳුන්වනු ලැබුවේ.

1. විජාතීන්ට ආලෝකයක් ගෙනදෙන කාන්තාවක ලෙස

2. මාගේ ස්වාමින්වහන්සේ ගේ මෑණියන් ලෙස

3. ඉශ්‍රායෙලුන් බොහෝ දෙනෙකු හරවන කෙනෙකු ලෙස

4. නිහතමානී පරාර්ථකාමී කාන්තාවක ලෙස

10. ජොහාන් යන නාමයෙහි අර්ථය

1. මෙහෙසුරු දිවැසිවරයා
2. පාඨකරයේ සැරිසරන්නා
3. දෙවියන් වහන්සේගේ දායාදය
4. දෙවියන් වහන්සේ මුදන සේක

11. කිතුනු බෞතිස්ම පිළිවෙත මගින්

1. ශුද්ධාත්ම බලය ජීවිත තුළ ක්‍රියා කිරීම අපේක්ෂා කෙරේ

2. සදාතන ජීවනයට හිමිකම් පෑමට අවස්ථාව ලැබේ

3. සියලු චාරිත්‍ර ප්‍රතික්ෂේප කිරීමට අවකාශ ලැබේ

4. ස්නානය කිරීම අර්ථවත් කරයි.

12. ධර්ම දූතයන් සැත්තෑදෙනා මෙන් අපද ලබන අත්දැකීමකි

1. දේව රාජ්‍යය වදන් මගින් ප්‍රකාශ කිරීම

2. රැකියාවට ප්‍රයෝගික පුහුණුවක් ලැබීම

3. දේව සේවයේ දී දෙවිඳුන් අපගේ අවශ්‍යතා සපයන බව

4. බොහෝ දෙනාගේ පිළිගැනීමට ලක්වීම

13. මිටියාවතේ දේශනය මගින් අනාවරණය කර ඇත්තේ

1. යහපත් දිවි පැවැත්මකට මාර්ගෝපදේශකත්වය

2. තමාට උසස් වීමට මගපෙන්වීමක්

3. සමාජයේ ගෞරවාදරයට පාත්‍රවන ක්‍රමයයි

4. තම සේවය නිසි ලෙස කරන ආකාරයයි

14. වර්තමාන සමාජයේ කිතුනුවන් පිරිසිවරුන් මෙන් ක්‍රියා කරන ආවස්ථාවකි

1. වීදි දරුවන් පුනරුත්තාපනය කිරීම.

2. අන්‍යාගමිකයන් හා සහයෝගයෙන් ජිවත්වීම.

3. මහළු අය සඳහා වැඩිහිටි නිවාස තනා දීම

4. ප්‍රසිද්ධිය තකා දේවස්ථාන ගොඩනැගීම

15. පිලාත් ඉදිරිපිට ජේසුස් වහන්සේට විරුද්ධව නගන ලද චෝදනාවක් වුයේ

1. අදිරාජ්‍යයාට බදු ගෙවීමට ආයාචනය කිරීම.

2. සැන්හෙඩ්‍රින් උසාවිය නොමග යැවීම.

3. තමා ක්‍රිස්තුස් නම් රජෙකු යයි ප්‍රකාශ කිරීම.

4. ජාතියට කැරලි ගැසීමේ ආදීනව පහදා දීම

(තුන්වන පිටුව බලන්න)

සියලු ම හිමිකම් ඇවිරිණි /
All Rights Reserved ]



16. රන් කාසි දසය ගැන උපමාව තුළින්

1. රන් කාසි වල වටිනාකම පෙන්වයි
2. සුළු දෙයක් ගැන වුව විශ්වාසවන්ත විය යුතු බව පෙන්වයි
3. මුළු ශක්තිය යොදා නැති වූවන් සෙවිය යුතු බව කියය
4. නිර්ලෝභීව පරිත්‍යාගශීලී වීමේ වැදගත්කම පෙන්වයි

17. ජේසුස් වහන්සේ තමා වෙත පැමිණි පරීක්ෂාවන්ට පිළිතුරු දුන්නේ,

1. ගීතාවලියෙනි
2. හිතෝපදේශයෙනි
3. උත්පත්ති කථාවෙනි
4. ද්විතීක නීති සංග්‍රහයෙනි

18. ස්නාවක ජොහාන් අද සමාජයට පැමිණියොත් සාමාන්‍ය ජනයාට කියනු ඇත්තේ කුමක් ද?

1. සාධාරණත්වයේ වටිනාකම
2. බලය නිවැරදිව යෙදීමේ වටිනාකම
3. ක්‍රියාකාරී ඇදහිල්ලක වටිනාකම
4. බෙදාගැනීමේ වටිනාකම

19. ජේස්සු වහන්සේගේ දේශනාවල මුලික හරය

1. ප්‍රේමය යි
2. දේව රාජ්‍යය යි
3. කමාව
4. සාමය

20. සාමය යථාර්ථයක් වීම සඳහා

1. දේශපාලනය ස්ථාවර විය යුතුය
2. යුක්තිය හා ධර්මිෂ්ඨකම තිබිය යුතුය
3. ප්‍රචණ්ඩත්වය පිටුදැකිය යුතුය
4. අනුන් විනිශ්චය නොකළ යුතුය

(2 × 20 = 40)

(සිව්වන පිටුව බලන්න)

සියලු ම හිමිකම් ඇවිරිණි /
All Rghts Reservrd /



## II කොටස

පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු ලියන්න.

(01) 1. ආබ්‍රහම් සමග දෙවියන් වහන්සේ ඇතිකරගත් ගිවිසුම තුළ දෙපාර්ශවයට පැවරුන කාර්යභාරය වෙන වෙනම ලියන්න.

2. දස පණත බෙදෙන ප්‍රධාන කොටස් 2 නම් කරන්න.

3. 'මෙහෙසුරු දිව්‍යසිවර' ලෙස හඳුන්වා ඇත්තේ කාවද? ඒ කුමන ප්‍රශංසා ගීයක ද?

4. නාසරෙත් හි සිනගෝගයේ දී ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ පිරුළු 2 ලියන්න.

5. රජකම හා බැඳුනු මෙසියානු සංකල්පයේ විශේෂ ලක්ෂණ 2 ක් ලියන්න.

6. ශු.ජොහාන් තුමා පවසන ලෙසට අයහපත් එඬේරුන්ගේ ක්‍රියාකලාපය කෙබඳු ද? කරුණු 2 ක් ලියන්න.

7. යෙසායා 53 ට අනුව දුක් දරන සේවකයාගේ ලක්ෂණ 2 ක් ලියන්න.

8. දේව රාජ්‍යයේ තීරණාත්මක මොහොතට මුහුණ දීමට ඔබ කළ යුතු පියවර 2 ක් ලියන්න

9. දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ ලක්ෂණ 2 ක් ලියන්න.

10. ප්‍රේම පාරමිතාවේ සඳහන් ප්‍රේමයේ ලක්ෂණ 2 ක් ලියන්න.

(ලකුණු 10 × 2 = 20)

(02) i. ''සමිඳාණෝ දුන් සේක, සමිඳාණෝ ගත් සේක, සමිඳුන් නමට ගරු පැසසුම් වේවා'' මෙසේ සඳහන් කරන්නේ කවුද? ඔහු ගැන කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 04)

ii. ඔහුට විඳින්ට සිදුවූ කරදර මොනවා ද? ඒවාට ඔහු මුහුණදුන් ආකාරය ලියන්න. (ලකුණු 06)

iii. මෙම කථාවට අමතරව දුක් විඳීම සම්බන්ධයෙන් දක්වා ඇති තවත් උදාහරණ 2ක් සඳහන් කොට එම සෑම සිදුවීමකින්ම කිතුනු දරුවෙකු වන ඔබට ගත හැකි මඟපෙන්වීම විස්තර කරන්න. (ලකුණු 10)

(03) i. ජේසුස් වහන්සේ වෙතින් ලැබෙන පරිපූර්ණ ජීවිතය තුළ දක්නට ලැබෙන ලක්ෂණ 4 ක් ලියන්න.

(ලකුණු 04)

ii. යහපත් බැටළු එඬේරෙකුගේ ලක්ෂණ 3 ක් සඳහන් කර ජේසුස් වහන්සේ මගින් ඒවා ඉටු වූ ආකාර උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

iii. අප එඬේරෙකු හා බැටළුවෙකු ලෙස ක්‍රියා කරන ආකාරය වෙන වෙනම විස්තර කරන්න.

(ලකුණු 10)

(04) පහත මාතෘකා අතරින් 2 ක් ගැන කෙටි සටහන් ලියන්න.

i. දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දු

ii. ස්නාවක ජොහාන්ගේ පෙරමග දූත කාර්යය

iii. නාසරෙත්හි දහම් දෙසුම

iv. ඔලීව කන්දේ යාච්ඤාව

(ලකුණු 20)